# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,452 - 2025 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2025.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 214 |
| බුද්ල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 216 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
(පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් හා පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් පෙර හඳුන්වන ලද)
අංක 450, ගාලු පාර,
කොළඹ 03.

| | | |
|---|---|---|
| නඩු අංකය | : | CHC/078/2022 MR. |
| ස්වභාවය | : | උකස් |
| කාර්ය පටිපාටිය | : | සාමාන්‍ය |
| වටිනාකම | : | ඇ. ඩොලර් 1,741,447.56<br>ශ්‍රී ලංකා මුදලින්<br>රු. 348,289,512/- |
| ඇස්කිසි අංකය | : | 25/2025 |

*...............පැමිණිලිකරු.*

*එදිරිව*

(1) බොරලැස්ගමුව, පැපිලියාන, කොළඹ පාර, අංක 362 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වා ගෙන යනු ලබන, දයා ඇපරල් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

(2) බොරලැස්ගමුව, පැපිලියාන, කොළඹ පාර, අංක 362 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වා ගෙන යනු ලබන, දයා ගෲප් (ප්‍රයිවෙට් ලිමිටඩ්).

*................විත්තිකරුවෝ.*

ඉහත අංක දරන නඩුවේ ඇතුලත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව එකී පැමිණිලිකරුට ඉහත 1 සහ 2 විත්තිකරුවන්ගෙන් සමථ කොන්දේසි කඩ කිරීමේ හේතුව මත පහත දැක්වෙන තීන්දු ප්‍රකාශිත මුදල වන,

(*අ*) වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 04 වැනි දිනට ඉහත කී ඇමෙරිකානු ඩොලර් 1,643,000.00 ක කාලීන ණය පහසුකම මත ඇමෙරිකානු ඩොලර් 1,650,986.80 ක් සහ වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 05 වැනි දින සිට ඇමෙරිකානු ඩොලර් 1,643,000.00 ක මුදල මත 5% ක වාර්ෂික පොළිය ද,

(*ආ*) වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 04 දිනට ඉහත කී ඇමෙරිකානු ඩොලර් 90,460.76 ක කාලීන ණය පහසුකම මත ඇමෙරිකානු ඩොලර් 90,460.76 ක මුදල ද ව්‍යාස්ථාපිත අයකිරීම් ද රජයේ බදු සහ අනෙකුත් ගාස්තු ද, පැමිණිලිකරුට ගෙවන ලෙස තීන්දු කර ඇත.

එකී මුදල සහ පොළිය අයකර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. වඩුතන්ත්‍රී විසින් ලියා සහතික කරන ලද 2012 නොවැම්බර් මස 06 වැනි දිනැති අංක 31 දරන උකස්කරයේ සහ 2017 ඔක්තෝබර් මස 30 වැනි දිනැති අංක 575 දරන ද්විතියික උකස්කරයේ උපලේඛනයේ සහ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති නිශ්චල දේපළ වන,

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 537 විලවල ග්‍රාම නිලධාරි වසමට අයත් විලෙවල කොට්ඨාස අංක 1 කලුබෝවිල නැගෙනහිර, දුටුගැමුණු වීදියේ පිහිටි වරිපනම් අංක 92 දරන කහටගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු කේ. එෆ්. එස්. ගුණසේකර විසින් වර්ෂ 2005 ක් වූ ජූනි මස 23 වැනි දින මැන සාදන ලද අංක 533 දරන පිඹුරෙහි දැක්වෙන අංක 01 දරන ඉඩම,

**වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 16 වැනි දින පෙ.ව. 10.30 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලේ පිහිටීම.*- හොරණ - කොළඹ මාර්ගයේ කොහුවල මංසන්ධියේ සිට කොළඹ දෙසට දුටුගැමුණු වීදිය ඔස්සේ කිලෝ මීටරයක් පමණ ගියවිට දුටුගැමුණු වීදියට මුහුණලා වම් පසින් මෙම දේපළ පිහිටා තිබේ. දේපළ වරිපනම් අංකය 92 වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්,

(*අ*) ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%) ද,

(*ආ*) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාර නියෝජ්‍ය පිස්කල් තැනගේ ගාස්තු ද,

(*ඇ*) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහ (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවෙහි බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 537 විලවල ග්‍රාම නිලධාරි වසමට අයත් විලෙවල කොට්ඨාස අංක 1 කලුබෝවිල නැගෙනහිර, දුටුගැමුණු වීදියේ පිහිටි වරිපනම් අංක 92 දරන කහටගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම (බලයලත් මිනින්දෝරු ජී. ආර්. නානායක්කාර විසින් වර්ෂ 1981 ක් වූ ජූලි මස 12 වැනි දින මැන සාදන ලද අංක 1029 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක සී1 සහ බලයලත් මිනින්දෝරු වී. පී. සමරවීර විසින් වර්ෂ 1999 ක් වූ ජූලි මස 21 වැනි දින මැන සාදන ලද අංක 3191/1 දරන පිඹුර දැක්වෙන කැබලි අංක බී1 දරන කොටස් ඒකාබද්ධ කිරීමෙන් සාදන ලද) බලයලත් මිනින්දෝරු කේ. එෆ්. එස්. ගුණසේකර විසින් වර්ෂ 2005 ක් වූ ජුනි මස 23 වැනි දින මැන සාදන ලද අංක 533 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක 01 දරන කැබැල්ල නමැති

උතුරු- නැගෙනහිරට : දුටුගැමුණු වීදිය, පාරක් සඳහා වෙන් කල කොටස සහ පිඹුරු අංක 3191 ප්‍රකාර කැබලි අංක 02 ද, දකුණු - නැගෙනහිරට : දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 96 සහ 96ඒ ද, දකුණු - බස්නාහිරට : පිඹුරු අංක 3191/1 ප්‍රකාර කැබලි අංක 1ඒ ද, උතුරු - බස්නාහිරට : දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 84 සහ 90 ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් එකයි දශම තුනයි අටක් (රූ. 2, පර්. 1.38) විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක F277/105 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමට යාම් ඊම් කිරීම සඳහා පහත සඳහන් ඉඩම හරහාවන මාර්ග අයිතිය ද වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 537 විලවල ග්‍රාම නිලධාරි වසමට අයත් විලවල කොට්ඨාස අංක 1 කලුබෝවිල නැගෙනහිර දුටුගැමුණ වීදියේ පිහිටි දුටුගැමුණු වීදියේ වරිපනම් අංක. 92 දරන කහටගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම මානක වී. පී. සමරවීර විසින් වර්ෂ 1996 ක් වූ ජනවාරි මස 05 වැනි දින මැන සාදන ලද අංක. 3191 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 02 (අඩි 12 ක් පළල පාරක් සඳහා වෙන් කල කොටස) දරන කොටසට මායිම් -

උතුරට : දුටුගැමුණු වීදිය සහ කැබලි අංක සී2බී2 ඒ ද, නැගෙනහිරට : කැබලි අංක සී2බී2ඒ ද සහ දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 96 ඒ ද, දකුණට : දුටුගැමුණු වීදියේ වරිපනම් අංක 96 ඒ ද සහ බස්නාහිරට මානක ජී. ආර්. නානායක්කාර සාදන ලද අංක 1041 ඒ පිඹුර ප්‍රකාර කැබලි අංක සී1 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම දෙකයි හයක් (පර්.10.26) විශාල ඉඩම සහ හරහා මාර්ග අයිතිය ද වේ.

මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක F277/104 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ප්‍රධාන රෙජිස්ට්‍රාර් සහ නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2025 ක් වූ අගෝස්තු මස 07 වැනි දින දී ය.

08-332

# විවිධ දැන්වීම්

පාර්ලිමේන්තුව

**නිපුනතා සංවර්ධන සහ පුහුණු කිරීමේ ජාත්‍යන්තර ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

ජේ. සී. අලවතුවල වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ "නිපුනතා සංවර්ධන සහ පුහුණු කිරීමේ ජාත්‍යන්තර ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ආයතනය සංස්ථාගත කිරීමයි:

(අ) විදේශීය උසස් අධ්‍යාපන ආයතනවල පවත්වාගෙන යනු ලබන වෘත්තීය අධ්‍යාපන පාඨමාලා අතරින් ශ්‍රී ලංකාව තුළ දී පවත්වාගෙන යා හැකි පාඨමාලා ශ්‍රී ලාංකික ප්‍රජාවට මෙරටදීම හැදෑරීමට පහසුකම් සැලසීම;

(ආ) දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට සරිලන ලෙස විධිමත් ක්‍රියාපරිපාටියක් යටතේ වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම; සහ

(ඇ) ශ්‍රී ලාංකීය තරුණ ප්‍රජාව සාර්ථක ව්‍යවසායකයන් ලෙස බල ගැන්වීම සඳහා ව්‍යවසායක පුහුණු පාඨමාලා පැවැත්වීම

යනාදිය වේ.

ජේ. සී. අලවතුවල,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

08-333

---

පාර්ලිමේන්තුව

**නේත්‍රා පැහැසරණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

හෙන්නායක මුදියන්සේලාගේ දිනිඳු සමන් කුමාර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "නේත්‍රා පැහැසරණ" පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී නේත්‍රා පැහැසරණ පදනම සංස්ථාගත කිරීමයි :

1. භාෂා පරිගණක හා වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කිරීම ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම.

2. සාහිත්‍ය කලා නිර්මාණ ඇගයීම හා අංකුර නිර්මාණකරුවන්ට අවස්ථාව සැලසීම.

3. ක්‍රීඩා ප්‍රවර්ධන ක්‍රීඩකයන් දිරිගැන්වීම හා සමාජ පොදු සුබසාධන කටයුතු සිදුකිරීම,

යනාදිය වේ.

එච්. එම්. ඩී. සමන් කුමාර,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
බදුල්ල දිස්ත්‍රික්කය.

08-334

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.